සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## භූගෝල විද්‍යාව

**නම/විභාග අංකය :-- ..........................................................................................** **කාලය : පැය 02යි.**

### I කොටස

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

♦ **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

1. පෘථිවිය තම අක්ෂය වටා ගමන් කිරීම ................................................ ලෙස හඳුන්වයි. (භ්‍රමණය, පරිභ්‍රමණය, පරිවහනය)
2. පෘථිවි ගෝලයේ මතුපිට වර්ගඵලය වර්ග කිලෝමීටර් මිලියන ..................................................... කි. (510, 610, 710)
3. පෘථිවි ආදර්ශ ගෝලයේ නැගෙනහිර සිට බටහිරට විහිදෙන මනඃකල්පිත රේඛා ..................................................... වේ.

   (අක්ෂාංශ, දේශාංශ, දිනරේඛා)
4. සාගර ජලයෙන් වට වූ විශාල ගොඩබිම් ප්‍රදේශ ................................................ ලෙස හැඳින්වේ. (දූපත්, මහාද්වීප, සාගර)
5. බෙංගාල බොක්ක ප්‍රදේශයේ හටගන්නා කැළඹීම් නිසා ........................................... ඇති වේ. (සංවහන, වාසුළි, මෝසම්)

♦ **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ කියවා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

6. මධ්‍යම කඳුකරයේ කඳු, සානු, දුර්ග මාර්ග හා දිය ඇළි බහුලව පිහිටා නැත. (නි / වැ)
7. පැසිපික් සාගරය ලෝකයේ විශාල ම සාගරය වේ. (නි / වැ)
8. කිසියම් රටක ආසන්න වටපිටාවේ ඇති සාගර ගොඩබිම් යනාදිය පදනම් කරගෙන පිහිටීම

   දැක්වීම සාපේක්ෂ පිහිටීම වේ. (නි / වැ)
9. ශ්‍රී ලංකාවේ නිරිත හා ඊසාන දෙසින් රට තුළට ඇතුළු වන කාලීන සුළං ධාරා මෝසම් සුළං

   ලෙස හැඳින්වේ. (නි / වැ)
10. ශ්‍රී ලංකාව බහු වාර්ගික සහ බහු ආගමික සංස්කෘතියක් ඇති රටකි. (නි / වැ)

♦ **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු පිළිතුර යොදා සම්පූර්ණ කරන්න.**

11. පෘථිවිය සූර්යයා වටා පරිභ්‍රමණය වීමට ගතවන කාලය දින ............................................ කි.
12. පෘථිවිය ගෝලාකාර වස්තුවක් ලෙස සැලකුව ද එය ................................................ ගෝලයක් නොවේ.
13. ශ්‍රී ලංකාවේ වෙරළ මායිමේ සිට නාවුක සැතපුම් 12 ක මුහුදු තීරය ...................................................... මුහුද ලෙස හඳුන්වයි.
14. සංස්කෘතික උරුමයන් අතර සිංහරාජය ....................................................... නිර්මිතයකි.
15. කැස්පියන් හා ඒරල් මුහුද ........................................................ මහද්වීපය තුළ පිහිටා ඇත.

♦ **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. කර්කටක නිවර්තනය පිහිටා ඇත්තේ සමකයට,

1. උතුරින් ය. 2. දකුණින් ය. 3. බටහිරින් ය. 4. නැගෙනහිරින් ය.

17. ශ්‍රී ලංකාවේ විශාලත්වය බලන විට දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා දුර වන්නේ,

1. කි.මී. 210 කි. 2. කි.මී. 432 කි. 3. කි. මී. 510 කි. 4. කි.මී. 410 කි.

18. අර්ධ ශුෂ්ක ප්‍රදේශවල දක්නට ලැබෙන වෘක්ෂ ලතා වර්ගය වන්නේ,

1. තද කොළ පැහැති ශාක ය. 2. වියන් සහිත ගස් ය.
3. කටුපඳුරු සහිත වන ලැහැබ් ය. 4. ඝන වනාන්තර ය.

19. හේන් වගාව බහුල ව දක්නට ලැබෙන්නේ,

1. තෙත් කලාපයේ ය. 2. වියළි කලාපයේ ය.
3. කඳුකර තෙත් කලාපයේ ය. 4. අතර මැදි කලාපයේ ය.

20. දකුණු ආසියා කලාපයේ ඉහළ සමාජීය සංවර්ධනයක් ඇති රට වන්නේ,

1. ඉන්දියාවයි. 2. පකිස්ථානයයි.
3. බංගලාදේශයයි. 4. ශ්‍රී ලංකාවයි. (ලකුණු 2 x 20 = 40)


## II කොටස

♦ **මෙම කොටසේ පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.**

♦ **තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

♦ **ඔබ පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.**

01. පහත දැක්වෙන ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. A අක්ෂරයෙන් දැක්වෙන සාගරය නම් කරන්න. (ලකුණු 1)

ii. B අක්ෂරයෙන් දක්වා ඇත්තේ මහද්වීපයකි. එය නම් කරන්න. (ලකුණු 1)

iii. C අක්ෂරයෙන් දක්වා ඇති සමුද්‍ර සන්ධිය කුමක් ද? (ලකුණු 2)

iv. D අක්ෂරයෙන් දක්වා ඇති දූපත නම් කරන්න. (ලකුණු 2)

v. කැස්පියන් මුහුද දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන් ද? (ලකුණු 2)

vi. සමකය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 2)

vii. F අක්ෂරය මගින් සේයා කර ඇති රට නම් කරන්න. (ලකුණු 2)

(ලකුණු 12)

02. i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප තුන නම් කරන්න. (ලකුණු 3)

ii. වෙරළබඩ තැනිතලාවේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. a. ශ්‍රී ලංකාවට උතුරින් පිහිටා ඇති මහද්වීපය හා දකුණින් පිහිටා ඇති සාගරය නම් කරන්න. (ලකුණු 2)

b. ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ලැබී ඇති වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 3)

03. i. ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ක්‍රම තුන නම් කරන්න. (ලකුණු 3)

ii. ශ්‍රී ලංකාවේ තෙත් ප්‍රදේශවල වනාන්තර ආශ්‍රිතව දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. a. පහත දැක්වෙන ස්ථානවල වෘක්ෂලතා ලක්ෂණ එක බැගින් සඳහන් කරන්න.

A. කඳුකර ප්‍රදේශවල

B. වියළි හා අර්ධ ශුෂ්ක ප්‍රදේශවල

C. වෙරළ ආශ්‍රිත කලපුවල (ලකුණු 3)

b. වනාන්තර වලින් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

04. i. ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව ජීවත් වන ප්‍රදේශ තුනක් සඳහන් කරන්න.

ii. අපේ සංස්කෘතික උරුමයන් කිහිපයක් පහත දැක්වේ. ඒවා ස්පෘශ්‍ය උරුම හා අස්පෘශ්‍ය උරුම ලෙස වෙන් කරන්න. (ලකුණු 3)

ශ්‍රී මහා බෝධිය, සීගිරිය, නැටුම්ගැයුම්, සිරිත්විරිත්, දිය ඇළි, ආගන්තුක සත්කාර. (ලකුණු 4)

iii. a. ශ්‍රී ලංකාවේ ඇති ලෝක උරුම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

b. ආදිවාසී ජනතාව නූතන ජන සමාජයට අනුවර්තනය වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

(ලකුණු 3)

05. යාබද රූපයෙන් දැක්වෙන්නේ මධ්‍යම කඳුකරයේ සටහනකි.

i. A හා B වලින් දක්වා ඇති කඳු දෙක නම් කරන්න. (ලකුණු 3)

ii. a. C හා D වලින් දැක්වෙන සානු දෙක නම් කරන්න. (ලකුණු 2)

b. මෙම කලාපයේ බහුලව ම වගා කරන භෝගය කුමක් ද? (ලකුණු 1)

c. මෙම ප්‍රදේශයේ මාර්ග ජාලයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් ලියන්න.

(ලකුණු 1)



iii. a. මෙම ප්‍රදේශයෙන් පටන් ගන්නා ගංගා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

b. දෙස් විදෙස් සංචාරකයන් මධ්‍යම කඳුකරයේ පරිසරයට ඇලුම් කිරීමට බලපාන හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

06. i. දකුණු ආසියා කලාපයේ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. රටක අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු වීම මඟින් ඇතිවන වාසි දෙකක් ලියන්න. (ලකුණු 4)

iii. a. ශ්‍රී ලංකාවේ ජන සමාජයේ පවතින සංස්කෘතික උත්සව දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

b. ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමක පැවතීම සඳහා බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 3)

07. i. වියළි කලාපීය භූ දර්ශනය ඇති වීමට බලපා ඇති සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 3)

ii. a. මෙම කලාපයේ ඇති ශේෂ කඳු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

b. මෙම ප්‍රදේශයේ ප්‍රධාන වගාව කුමක් ද? (ලකුණු 2)

iii. a. මෙම කලාපයේ පිහිටා ඇති වනෝද්‍යාන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

b. වියළි කලාපීය භූ දර්ශනය තුළ ජල හිඟයට පිළියම් ලෙස ගෙන ඇති විසඳුම් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 3)

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. පරිභ්‍රමණය | 02. 510 | 03. අක්ෂාංශ | 04. මහද්වීප |
| 05. වාසුළි | 06. වැ | 07. නි | 08. නි |
| 09. නි | 10. නි | 11. 365 | 12. පූර්ණ/සම්පූර්ණ |
| 13. රාශ්ට්‍රීය | 14. ස්වාභාවික | 15. ආසියා | 16. උතුරින් |
| 17. ක්‍රි.මී. 432 | 18. කටුපඳුරු හා වන ලැහැබ් | 19. වියළි කලාපය | 20. ශ්‍රී ලංකාව |

### II කොටස

01. i. අත්ලන්තික් සාගරය    ii. අප්‍රිකා මහද්වීපය
iii. පෝක් සමුද්‍ර සන්ධිය    iv. මැඩගස්කරය
v. G    vi. J
vii. ඇමෙරිකා එක්සත් ජනපදය/ඇමෙරිකාව

02. i. වෙරළබඩ තැන්න, අභ්‍යන්තර තැනිතලාව, මධ්‍යම කඳුකරය
ii. කලපු, බොකු, තුඩු, දඹ, දූපත්, තැනිතලා
iii. a. උතුරෙන් - ආසියාව
දකුණින් - ඉන්දියන් සාගරය
b. මෝසම් සුළංවල බලපෑම, උෂ්ණත්වය, වර්ෂාපතනය බලපෑම.
විවිධ ජාතීන් වෙළෙඳාම සඳහා පැමිණීම.
දූපතක් ලෙස පිහිටීම නිසා උෂ්ණත්වය සමනය වීම.
රජවරු අතර මිත්‍ර සබඳතා ඇති වීම තුළින් ආගමික සංස්කෘතීන් පෝෂණය වීම.
විවිධ ශිල්පීන්ගේ සහාය ලැබීම ආදිය.

03. i. සංවහන, මෝසම්, වාසුලි
ii. ගස් උසට වැඩීම, ඝන වනාන්තර වීම.
ගස් බහුල වීම.
යටි රෝපණ ඇති වීම.
වනාන්තර තද කොළ පැහැති වීම.
iii. A. කඳුකර ප්‍රදේශවල - ගස් උසින් අඩු වීම.
වියනක් සේ ගස් පැතිරීම.
වනාන්තර ඝනව නොමැති වීම.
තැනින් තැන ගස් තිබීම.
පතන හා තෘණ තලාබිම් තිබීම.

B. වියළි හා අර්ධ ශුෂ්ක ප්‍රදේශ - කටුපඳුරු, වන ලැහැබ් තිබීම.
ගස් තැනින් තැන පිහිටීම.
ගස් උස අඩු වීම.

C. වෙරළ ආශ්‍රිත - කඩොලාන ශාක බහුල වීම.
මුල් බහුල ශාක තිබීම.
ගිං පොල්, කඩොල්, ඉකිරිය වැනි ශාක බහුල වීම.

**Answer**

04. i. හෙන්නානිගල, මහියංගණය, දඹාන, නිල්ගල

ii. ස්පෘශ්‍ය උරුම - ශ්‍රී මහා බෝධිය, සීගිරිය, දිය ඇළි

අස්පෘශ්‍ය උරුම - නැටුම්ගැයුම්, සිරිත්විරිත්, ආගන්තුක සත්කාර

iii. a. සිංහරාජය, සීගිරිය, දඹුලු විහාරය, ගාලු කොටුව, අනුරාධපුර ශුද්ධ නගරය

b. විධිමත් අධ්‍යාපනයේ නියැලීම.

උසස් අධ්‍යාපනය ලැබීම.

නවීන විද්‍යුත් මෙවලම් භාවිතය.

ඇඳුම් පැළඳුම් විලාසිතා භාවිතය.

05. i. A. පිදුරුතලාගල

B. සමනල කඳු පන්තිය

ii. a. C - වැලිමඩ සානුව

D - මහවෙල තැන්න සානුව

b. තේ

c. වංගු සහිත වීම, දුර්ග මාර්ග තිබීම.

iii. a. මහවැලි, කැළණි, වලවේ, කළු, මාඔය ආදිය

b. ශීත දේශගුණය

පරිසර සුන්දරත්වය

මනස්කාන්ත දිය ඇළි පිහිටා තිබීම

විසිතුරු මල් වගාවන්

විවේකය හා විනෝද කටයුතු සඳහා වෙන් වූ බිම් ප්‍රදේශ

06. i. ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, භූතානය, පකිස්ථානය

ii. සාක්ෂරතාවය වැඩිවීම — ජීවන මට්ටම ඉහළ යෑම

හොඳ රැකියා අවස්ථා — යහපත් ආකල්ප

iii. a. වෙසක් උත්සවය — අවුරුදු උත්සවය

දීපවාලී උත්සවය — රාමසාන් උත්සවය ආදිය

b. නොමිලේ වෛද්‍ය පහසුකම් සැලසීම.

නොමිලේ අධ්‍යාපන පහසුකම් ලබා දීම.

රෝග නිවාරණය සඳහා එන්නත් නොමිලේ දීම.

විධිමත් සෞඛ්‍ය සේවා ලබා දීම.

මරණ අනුපාතය අඩු වීම.

ආයු අපේක්ෂාව වැඩි වීම ආදිය.

07. i. උෂ්ණත්වය වැඩි වීම

අඩු වර්ෂාපතනය

ඉහළ වාෂ්පීකරණය

වර්ෂාවේ අවිනිශ්චිතතාවය ආදිය.

ii. a. මිහින්තලය, කතරගම, රිටිගල, සීගිරිය, දඹුල්ල ආදිය.

b. වී

iii. a. යාල, විල්පත්තු, කුමන, සෝමාවතිය, මාදුරුඔය, වස්ගොමුව

b. වැව් අමුණු ඉදි කිරීම.

ජල යෝජනා ක්‍රම ඇති කිරීම. (මාදුරුඔය, ගල්ඔය, උඩවලවේ)

වගා ළිං ඉදි කිරීම.

ඇළ මාර්ගවලින් ජලය බෙදා හැරීම.